ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 අගෝස්තු මස 03 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: 2018 - අංක 05

### ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගනී

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2018 අගෝස්තු මස 02 වැනි දින පැවති රැස්වීමේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට තීරණය කළේය. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.50 මට්ටමේ පවතී. මුදල් මණ්ඩලයේ මෙම තීරණය, මැදිකාලීන වශයෙන් උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ ස්ථාවර කිරීම සහ එමගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ සහ තිරසාර වර්ධනයක් පවත්වා ගැනීම සඳහා දායක වීම යන මහ බැංකුවේ අරමුණු හා අනුකූල වේ. මුදල් මණ්ඩලය මෙම තීරණය වෙත එළැඹීමේ දී දැනට පවත්නා සහ අපේක්ෂිත දේශීය සහ ගෝලීය ආර්ථික වර්ධනයන් පුළුල් ලෙස සලකා ඇත.

**අවිනිශ්චිතතාව ඉහළ යෑම මධ්‍යයේ වුවද ගෝලීය ආර්ථික වර්ධනය ශක්තිමත් වෙමින් පවතී.**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත ලෝක ආර්ථික දැක්මෙහි (WEO, ජූලි 2018) නවතම දත්ත අනුව, රටවල් අතර අසමතුලිත ආර්ථික වර්ධනයක් පැවතියද, 2018 සහ 2019 වසර තුළදී ගෝලීය ආර්ථිකය ශක්තිමත් වන බව තහවුරු කර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ අනෙකුත් ප්‍රධාන ආර්ථිකවල මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම, එ.ජ. ඩොලරය ශක්තිමත් වීම, නැඟී එන වෙළඳපොළ ආර්ථිකයන්ගේ විනිමය අනුපාතික මත ඇති පීඩනය සහ ජාත්‍යන්තර වෙළඳ ගැටුම් ඉහළ යෑම යන අවදානම් ගෝලීය ආර්ථික වර්ධනය මත සෘණාත්මකව බලපානු ඇත. ඇතැම් නැඟී එන වෙළඳපොළ ආර්ථික සිය මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම මඟින් සහ විනිමය අනුපාතික සුදුසු ලෙස වෙනස් වීමට ඉඩ සැලසීමෙන් මෙම අවදානම් තත්ත්ව සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

**2018 දෙවන කාර්තුව තුළදී දේශීය ආර්ථිකයේ ක්‍රමික වර්ධනයක් අපේක්ෂා කෙරේ.**

ප්‍රධාන ආර්ථික දර්ශක සහ වර්තමාන පුරෝකථන අනුව, 2018 වසරේ දෙවන කාර්තුවේ සිට ශ්‍රී ලංකා ආර්ථිකයේ මූර්ත වර්ධනයෙහි ක්‍රමික ඉහළ යෑමක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. යහපත් කාලගුණික තත්ත්වයන්, 2018 වසරේ දෙවන භාගය තුළ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ඒ ආශ්‍රිත කර්මාන්ත මත හිතකර බලපෑම් ඇති කරනු ඇතැයි ද, එමගින් සමස්ත ආර්ථික වර්ධනයට සහාය වනු ඇතැයි ද අපේක්ෂිත අතර, ඒ සඳහා සේවා සහ කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනය ද දායක වනු ඇත. අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව මධ්‍යයේ වුවද, තරගකාරී නම්‍යශීලී විනිමය අනුපාතිකය, අඩු උද්ධමනකාරී පරිසරය සහ අපනයන හා ආයෝජන දිරි ගැන්වීම සඳහා වන ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් තුළින් සහාය ලබමින් මැදිකාලීනව ආර්ථිකය සිය උපරිම නිෂ්පාදන මට්ටම කරා ළඟා වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

**මැතකාලීනව ඉහළ යෑමක් වාර්තා කළ ද උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ පවතී.**

2018 පෙබරවාරි-ජූනි මාසවලදී අඩු තනි අගයක පැවති වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2018 ජූලි මාසයේදී අපේක්ෂා කරන ලද ආකාරයෙන් ඉහළ ගියේය. දේශීය ඛනිජ තෙල් මිල ඉහළ නැංවීම සහ මිල උච්චාවචන සහිත ආහාර මිල ගණන් ඉහළ යෑම මෙන්ම, පදනම් බලපෑම හේතුවෙන් මෑතකාලීනව ඇතිවූ තාවකාලික මිල පීඩන මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. අගෝස්තු මාසයේදී ද උද්ධමනය, උද්ධමන ඉලක්කය වන සියයට 4-6 පරාසයෙහි ඉහළ සීමාවේ පවතිනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර, 2018 වසරේ තෙවන කාර්තුව අවසානය වන විට අස්වැන්න ලැබීමත් සමඟ උද්ධමනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ස්ථාවර යටිදැරි උද්ධමනය සහ ස්ථාවර ලෙස පාලනය වී ඇති උද්ධමන අපේක්ෂා මගින් මනාව පාලනය වූ සමස්ත ඉල්ලුම් පීඩන පෙන්නුම් කරන අතර, එය මැදිකාලීනව උද්ධමනය මැදි තනි අගයක පවත්වා ගැනීමේ පුරෝකථන සඳහා සහාය වනු ඇත.

**වෙළෙඳපොළෙහි අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව සඳහා කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික ප්‍රතිචාර දක්වමින් පවතින අතර, මුදල් ප්‍රසාරණය අඛණ්ඩව ක්‍රමයෙන් මන්දගාමී විය.**

දේශීය මුදල් වෙළඳපොළෙහි පවතින අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වයට ප්‍රතිචාර දක්වමින් කෙටිකාලීන පොලී අනුපාතික අඩු වීමක් දක්නට ලැබිණි. ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ රාජ්‍ය සුරැකුම්පත් එලදා අනුපාතික මෑතකදී පහළ ගියේය. මෙම වර්ධනයන් හා සමගාමීව අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික, විශේෂයෙන්ම ණය පොලී අනුපාතික ඉදිරි කාලයේදී අඩු වනු ඇතැයි ද එමගින් දැනට ණය ගනුවන් මුහුණ දෙන ඉහළ මූර්ත පොලී අනුපාතික අඩු වනු ඇතැයි ද අපේක්ෂිතය.

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනය අඛණ්ඩව ක්‍රමයෙන් අපේක්ෂිත මට්ටම දක්වා මන්දගාමී විය. පෞද්ගලික අංශය වෙත

සපයන ලද ණය වර්ධනය මන්දගාමී වීම මෙන්ම බැංකු අංශය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය අඩු වීම හේතුවෙන් 2018 ජූනි මාසයේදී සමස්ත මුදල් ප්‍රසාරණය ද මන්දගාමී විය. මුදල් සහ ණය ප්‍රසාරණයෙහි මෙම ප්‍රවණතා ඉහළ මූල්‍ය ස්ථාවරත්වයක් පෙන්නුම් කරන අතර, එය ආර්ථිකයේ අපේක්ෂිත මැදිකාලීන වර්ධන මාවත හා සමාගාමී වේ.

**විදේශීය අංශය මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් වාර්තා කළේය.**

2018 වසරේ මැයි මාසයේදී අපනයන ආදායමෙහි වර්ධනය, ආනයන වියදමෙහි වර්ධනයට වඩා වැඩි වීම හේතුවෙන් වෙළඳ හිඟය යම්තාක් දුරකට අඩු විය. ජංගම ගිණුම ශක්තිමත් කිරීම සඳහා සහාය වෙමින් 2018 වසරේ මේ දක්වා කාලය තුළදී සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව වර්ධනය විය. රත්‍රන් සහ මෝටර් රථ ආනයනවල ඉහළ වර්ධනය පාලනය සඳහා මෑතකාලීනව ගනු ලැබූ ක්‍රියාමාර්ග තුළින් ගෙවුම් තුලනය මත වෙළඳ ගිණුමේ හිඟය මගින් ඇති වන පීඩනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, අනෙකුත් නැඟී එන වෙළඳපොළ ආර්ථික තුළ දක්නට ලැබුණු පරිදි රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ විදේශ ආයෝජන පිටතට ගලා යෑමක් වාර්තා විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ වෙතින් ප්‍රාග්ධන ගලා යෑම් වාර්තා වුව ද, ප්‍රාථමික වෙළඳපොළ තුළ ගනුදෙනු හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ ලැබීම් වාර්තා විය. එ.ජ. ඩොලරය ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පුළුල් ලෙස ශක්තිමත් වීම පිළිබිඹු කරමින් 2018 වසරේ අප්‍රේල් මස අග භාගයේ සිට විනිමය අනුපාතිකය මත යම් පීඩනයක් ඇති වුවද, 2018 වසරේ ජූලි මස අවසානය වන විට විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ පීඩනය යම්තාක් දුරකට අඩු විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින් 2018 වසරේ මේ දක්වා කාලය තුළදී එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සියයට 4.2 කින් අවප්‍රමාණය වී ඇත. මෙම වර්ධනයන් මධ්‍යයේ, 2018 වසරේ ජූලි මස අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 133.9 ක විදේශ විනිමය මිලදී ගනු ලැබීය. දළ නිල සංචිත ප්‍රමාණය, 2017 වසර අවසානය වන විට

වාර්තා කරන ලද එ.ජ. ඩොලර් බිලියන 8.0 හා සැසඳීමේදී 2018 ජූලි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 8.4 ක් දක්වා වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු ගත කොට ඇත.

**ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවත්නා මට්ටමේ පවත්වා ගනු ලැබේ.**

පවතින සහ අපේක්ෂිත සාර්ව ආර්ථික වර්ධනයන් මත පදනම්ව දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගැනීම යෝග්‍ය බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස විය. ඒ අනුව, මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 8.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 7.50 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාගේ ප්‍රධානත්වයෙන් අද දින (2018 අගෝස්තු 03) පෙ.ව. 11.30 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මාධ්‍ය හමුවක් පැවැත්වේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2018 සැප්තැම්බර් මස 28 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**දත්ත ඇමුණුම:**

## සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | මාර්-18 | අප්‍රේ-18 | මැයි-18 | ජුනි-18 | ජූලි-18 |
|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 4.2 | 3.8 | 4.0 | 4.4 | 5.4 |
| | ජා.පා.මි.ද. (2013=100) | 2.8 | 1.6 | 2.1 | 2.5 | - |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 3.4 | 3.5 | 3.2 | 3.4 | 3.9 |
| | ජා.පා.මි.ද. (2013=100) | 1.9 | 1.9 | 1.7 | 1.8 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මාර්-18 | අප්‍රේ-18 | මැයි-18 | ජුනි-18 | මාර්-18 | අප්‍රේ-18 | මැයි-18 | ජුනි-18 |
| සංචිත මුදල් | 997 | 1,000 | 973 | 999 | 11.8 | 12.9 | 13.2 | 12.0 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 6,607 | 6,692 | 6,671 | 6,748 | 16.4 | 16.8 | 15.0 | 14.9 |
| ශුද්ධ විදේශීය වත්කම් | 106 | 119 | 74 | 101 | 128.6 | 135.0 | 123.4 | 141.1 |
| ශුද්ධ දේශීය වත්කම් | 6,500 | 6,572 | 6,597 | 6,646 | 7.5 | 8.2 | 7.8 | 8.6 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 2,278 | 2,322 | 2,324 | 2,273 | 2.9 | 5.3 | 3.8 | 1.7 |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය | 557 | 581 | 608 | 619 | -2.6 | 0.8 | 4.8 | 8.5 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 5,022 | 5,044 | 5,073 | 5,156 | 15.3 | 15.3 | 15.1 | 14.9 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 8,112 | 8,218 | 8,207 | 8,244 | 16.7 | 16.8 | 15.1 | 14.2 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2018 මාර්. අවසානයට | 2018 අප්‍රේ. අවසානයට | 2018 මැයි අවසානයට | 2018 ජූනි අවසානයට | 2018 ජූලි අවසානයට | 2018 අගෝ.2 දිනට |
|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.75 | 8.50 | 8.50 | 8.50 | 8.50 | 8.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 8.41 | 7.86 | 7.93 | 8.50 | 8.46 | 8.34 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | |
| දින 91 | 8.17 | 8.10 | 8.34 | 8.32 | 8.24 | 8.17 |
| දින 182 | - | - | 8.93 | 8.85 | 8.74 | - |
| දින 364 | 9.69 | 9.59 | 9.62 | 9.39 | 9.27 | 9.23 |
| **ණය අනුපාතික** | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 11.55 | 11.21 | 11.42 | 11.33 | 11.44 (අ) | - |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 14.04 | 14.13 | 14.06 | 14.05 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 14.25 | 14.29 | 14.15 | 13.94 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 9.00 | 8.98 | 8.91 | 8.92 | 8.64 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 11.41 | 11.38 | 11.23 | 11.26 | 10.82 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 10.33 | 10.75 | 10.67 | 10.57 | - | - |

(අ) 2018 ජූලි 26 වන දිනට බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා)

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*